සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA2 විභාගය - 2019 ජූලි

## (AA25) ව්‍යාපාර නීතිය හා ආචාරධර්ම

(Business Law and Ethics)

2019-07-20
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය)**:**
  - (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
    *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*
  - (4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (6) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්ය ප්‍රශ්න දහය (10) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.7 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, අපරාධ නීතියෙහි මුල් අධිකරණ බලය ඇත්තේ කුමන අධිකරණයකට ද?

(1) ශ්‍රේෂ්ඨාධිකරණය. (2) අභියාචනාධිකරණය.
(3) දිස්ත්‍රික් අධිකරණය. (4) මහේස්ත්‍රාත් අධිකරණය.

**1.2** ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළව පහත දැක්වෙන ප්‍රකාශන සලකා බලන්න:

**(a)** එමගින් ජාතික රාජ්‍ය භාෂාවට අදාළ ගැටළු (issues) පිළිබඳව කටයුතු කරයි.

**(b)** එමගින් මිනීමැරීම් වෙනුවෙන් දඬුවම් සංවේදනය (stipulates) කරයි.

**(c)** එමගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කාර්යයන් සහ බලතල පිළිබඳ කටයුතු කරයි.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, නිවැරදි ප්‍රකාශනය / ප්‍රකාශන වන්නේ:

(1) **(a)** පමණි. (2) **(b)** පමණි.
(3) **(a)** සහ **(b)** පමණි. (4) **(a)** සහ **(c)** පමණි.

**1.3** උතුරු පළාතේ පිහිටා තිබෙන සියලුම ඉඩම් පාලනය කරනු ලබන්නේ:

(1) රෝම ලන්දේසි (Roman Dutch) නීතිය මගිනි. (2) ඉංග්‍රීසි නීතිය මගිනි.

(3) තේසවලාමෙයි (Thesawalamai) නීතිය මගිනි. (4) මුස්ලිම් නීතිය මගිනි.

**1.4** නීතියේ විවිධ අංශවලට (branches) අදාළ පහත සඳහන් ප්‍රකාශන සළකා බලන්න:

**(a)** උපත්, විවාහ, දික්කසාද, දරුකමට හදාගැනීම් ආදිය සඳහා පුද්ගලික / පවුල් නීතිය අදාළ වේ.

**(b)** ණයගෙවා ගැනීමට නොහැකි බවට අධිකරණය මගින් ප්‍රකාශ කරනු ලැබූ පුද්ගලයන් හෝ ව්‍යාපාර සම්බන්ධයෙන් බංකොලොත්භාවය නොහොත් බුන්වත්භාවයට අදාළ නීතිය මගින් ක්‍රියාකරනු ලැබේ.

**(c)** ඉඩම් සහ වංචල දෑ, උකස් ණයකර, කල් බදු ආදියෙහි හිමිකම් ලියාපදිංචිය පිළිබඳව දේපළ නීතිය ක්‍රියාකරනු ලැබේ.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, නිවැරදි ප්‍රකාශනය / ප්‍රකාශන වන්නේ:

(1) **(a)** සහ **(b)** පමණි. (2) **(b)** සහ **(c)** පමණි.

(3) **(a)** සහ **(c)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම.

**1.5** පහත සඳහන් ඒවා අතුරෙන්, ගිවිසුමක ප්‍රතිඥාහාරයක් (warranty) කඩකිරීමක් සඳහා ඇති නිවැරදි ප්‍රතිකර්මයක් (remedy) වන්නේ කුමක් ද?

(1) වන්දි සඳහා හිමිකම් පෑම. (2) නියත ඉටුකිරීමේ ආඥාවක් ලබා ගැනීම.

(3) තහනම් ආඥාවක් ලබාගැනීම. (4) ගිවිසුම අවසාන කිරීම.

**1.6** භාණ්ඩ විකිණීමේ ආඥා පනතට අනුව විකුණුම් ගිවිසුමක් ඇති කළ හැකි වන්නේ:

**(a)** ලිඛිතවයි.

**(b)** කට වචනයෙනි.

**(c)** කොටසක් ලිඛිතව සහ කොටසක් කටවචනයෙනි.

**(d)** පාර්ශවකරුවන්ගේ හැසිරීමෙනි.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, නිවැරදි ප්‍රකාශනය / ප්‍රකාශන වන්නේ:

(1) **(a)** සහ **(b)** පමණි. (2) **(b)** සහ **(c)** පමණි.

(3) **(a), (b)** සහ **(c)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම.

**1.7** පහත සඳහන් ඒවා අතුරෙන්, ජාත්‍යන්තර වෙළදාමෙහිදී භාවිත කෙරෙන ගෙවීම් ක්‍රමයක් **නොවන්නේ** කුමක් ද?

(1) විනිමය බිල්පත්.

(2) චෙක්පත්.

(3) අයකර ගැනීමේ එකඟතාවයන් (collection agreements).

(4) අත්තිකාරම් ගෙවීම (payment in advance).

*අංක 1.8 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.8** රක්ෂණයේ ප්‍රතිලාභ දෙකක්(02) සඳහන් කරන්න.

**1.9** 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනත යටතේ දක්වා ඇති වැරදි (offences) දෙකක්(02) සඳහන් කරන්න.

**1.10** වෘත්තීය ආචාරධර්මයන්හි මූලික මූලධර්මයක් ලෙස අපක්ෂපාතීත්වය (objectivity) යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 20)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න පහ (05) කි.

(මුළු ලකුණු 25)

### 02 වන ප්‍රශ්නය

2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ හොඳම සිංහල නවකතාව සඳහා වූ සම්මානය **මායාගේ** අලුත්ම නවකතාව සඳහා ප්‍රදානය කෙරිණි. කීර්තිමත් පොත් ප්‍රකාශකයන් කීප දෙනෙකුම ඇගේ නවකතාව ප්‍රකාශයට පත්කිරීම කෙරෙහි ඔවුන්ගේ උනන්දුව ප්‍රකාශ කර ඇත. ඇය ඔවුන් සමඟ සාකච්ඡා කිරීමට කැමැත්තෙන් සිටියි. කෙසේවෙතත්, කර්මාන්තයට නවකයෙකු වන බැවින් නවකතාව සම්බන්ධයෙන් ඇයට ඇති අයිතිවාසිකම් පිළිබඳව දැනගැනීමට ඇයට අවශ්‍යව ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනත අනුව, **මායාට** තිබෙන ආර්ථික අයිතිය සහ සදාචාරාත්මක අයිතිය **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

### 03 වන ප්‍රශ්නය

**අමර** ට ඔහුගේ මෝටර් කාර් රථය සඳහා **සීමාසහිත ABC රක්ෂණ සමාගමෙන්** රක්ෂණ ආවරණයක් ලබාගැනීමට අවශ්‍ය විය. ඔහු මෝටර් කාර් රථය ඇත්ත වශයෙන් ඔහුගේ නිවස යාබද වීදියේ නවතා තිබෙන නමුත් රක්ෂණ අයදුම්පත පිරවීමේදී ගරාජයක් ඇතුලේ නවතා තබන්නේයැයි වැරදිමකින් සඳහන් කළේය. එක් දිනක වීදියේ නවතා තිබියදී ඔහුගේ මෝටර් කාර් රථයට හානි සිදුවිය. **සීමාසහිත ABC රක්ෂණ සමාගමෙන්** වන්දි සඳහා හිමිකම් පෑමට **අමර** බලාපොරොත්තු වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත ABC රක්ෂණ සමාගමෙන්, අමරට** වන්දි සඳහා හිමිකම් පෑ හැකිදැයි **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

### 04 වන ප්‍රශ්නය

සපත්තු නිෂ්පාදන සමාගමක් මෑතකදී ආරම්භ කළ **ශාන්ත,** තරුණ ව්‍යාපාරිකයෙකි. තායිලන්තය පාදක කරගත් ව්‍යාපාරයක් වූ **"චින් චින්"** ආයතනයට සපත්තු අපනයනය කිරීමේ ව්‍යාපාරික ගනුදෙනුවක් ලබා ගැනීමට ඔහු සමත් විය. CIF (පිරිවැය, රක්ෂණ සහ නැව් ගාස්තු) ගිවිසුමක් මගින් ගනුදෙනුව ඉටු කිරීමට ඔවුහු එකඟ වූහ. මෙය තම ප්‍රථම ජාත්‍යන්තර ගනුදෙනුව බැවින් CIF ගිවිසුමක් යටතේ CIF විකුණුම්කරුවෙකුගේ වගකීම් මොනවාදැයි දැනගැනීමට **ශාන්තට** අවශ්‍යව ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

CIF විකුණුම්කරුවෙකු වශයෙන් ඔහුගේ ප්‍රධාන වගකීම් **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## **05** වන ප්‍රශ්නය

**රාජා** සහ **කමනී** ළදරු ඇඳුම් නිපදවීමේ හවුල් ව්‍යාපාරයක් ආරම්භ කළහ. ඔවුහු දෙදෙනාම ඔවුන්ගේ ව්‍යාපාරය සංවර්ධනය කිරීමෙහිලා එක්ව වැඩ කළහ. කෙසේවෙතත්, **රාජා,** ඇඳුම් නිපදවීමට ගන්නා රෙදිපිළ ද්‍රව්‍ය වට්ටම් කළ මිලක් යටතේ තොග වෙළෙන්දෙකුගෙන් මිලට ගෙන තිබුණ නමුත්, වෙළෙඳපොළ මිලටම ඒවා හවුල් ව්‍යාපාරයට විකුණා ඇති බව **කමනී** සොයා ගත්තාය. **රාජා** එම ගනුදෙනුව තුළින් රහස්‍ය ලාභයක් උපයාගෙන තිබූ අතර, **කමනී** සමග එය බෙදා නොගත්තේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

මේ සම්බන්ධයෙන් **කමනීගේ** නෛතික හිමිකම් සහ **රාජාගේ** වගකීම් **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## **06** වන ප්‍රශ්නය

**පියුමි** සහ **තාමල්** යනු රටේ ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙකු වූ අභාවප්‍රාප්ත **පෙරේරා** මහතාගේ දරුවන්ය. **පෙරේරාට** අයිතිව තිබූ **සීමාසහිත පෙරේරා (පෞද්ගලික) සමාගමේ** අධ්‍යක්ෂවරයෙකු ලෙස **තාමල්** දැනට ක්‍රියාකරන අතර, **පියුමි** සහ **ශ්‍රීලාල්, සීමාසහිත පෙරේරා (පෞද්ගලික) සමාගමේ** අධ්‍යක්ෂකවරුන් ලෙස පත්කිරීමට ඔහුට අවශ්‍යව ඇත. **පියුමිගේ** වයස අවුරුදු 16 කි. කෙසේවෙතත්, වර්ෂ 3 කට පමණ පෙර චෙක්පත් වංචා කිරීමක් සම්බන්ධයෙන් සහ ඇතුළත රහස් හෙළිදරව් කිරීම සම්බන්ධ වැරදිවලට **ශ්‍රීලාල්** වරදකරුවකු වූ බැවින් **තාමල්ගේ** තීරණයට තමා විරුද්ධ වන බව දැනට සිටින අධ්‍යක්ෂකවරයෙකු වන **තිලක්** සඳහන් කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත පෙරේරා (පෞද්ගලික) සමාගමේ** අධ්‍යක්ෂකවරුන් ලෙස කටයුතු කිරීම සඳහා **පියුමිගේ** සහ **ශ්‍රීලාල්ගේ** යෝග්‍යතාවය **විමසන්න**. (ලකුණු 05)

*B කොටසෙහි අවසානය*

## <u>C කොටස</u>

අනිවාර්ය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## **07** වන ප්‍රශ්නය

**රාජිත,** ආහාර භෝජනශාලා ව්‍යාපාරයක් නුගේගොඩ පවත්වාගෙන ගියේය. එය **සීමාසහිත ඇලීනා (පෞද්ගලික) සමාගම** විසින් අත්පත් කරගන්නා ලද අතර, එම සමාගමේ සාමාන්‍යාධිකාරී ලෙස **රාජිත** පත්කරන ලදී. මිලදී ගැනීම් කිසිවක් ණයට නොකරන ලෙසට **රාජිතට** උපදෙස් දෙන ලදී. කෙසේවෙතත්, ව්‍යාපාරයේ අයිතිය වෙනස්වීමට පෙර කළ ආකාරයටම **සීමාසහිත ලයන් සමාගමෙන්** බීම වර්ග රාශියක් ණය කොන්දේසි මත ඔහු විසින් නොකඩවා මිලදී ගැනීම සිදුකරන ලදී. **සීමාසහිත ඇලීනා (පෞද්ගලික) සමාගම, රාජිත** විසින් සිදුකළ ණයට මිලදී ගැනීම් සඳහා ගෙවීම ප්‍රතික්ෂේප කළේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත ඇලීනා (පෞද්ගලික) සමාගමට, සීමාසහිත ලයන් සමාගමට** ගෙවීම, ප්‍රතික්ෂේප කළ හැකිදැයි **විමසන්න.**
(ලකුණු 10)

## 08 වන ප්‍රශ්නය

**තාරා** ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්ව විද්‍යාලයක අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකාවකි. විශ්ව විද්‍යාලයේ සේවිකාවක ලෙස සේවක භාර අරමුදලට [Employee's Trust Fund (ETF)] ඇයට හිමිකම් ඇති බව ඇයගේ පත්වීමේ ලිපියේ සඳහන් විය. කෙසේවෙතත්, වර්ෂ 5 ක සේවා කාලය අවසානයේ ඇගේ උසස් අධ්‍යාපනය සඳහා රටහැර යාම පිණිස විශ්ව විද්‍යාලයෙන් ඉල්ලා අස්වීමට ඇය තීරණය කළාය. ඇය රටහැර යාමට පෙර ඇගේ සේවක භාර අරමුදලේ දායක මුදල් ආපසු ලබා ගැනීමට ඇයට අවශ්‍ය විය.

**තාරාගේ** සැමියා වන **ශිවා** වර්ෂ 10 කට වඩා වැඩි කාලයක් පාවහන් සමාගමක සේවය කරයි. ඔහු රු.35,000/- ක මාසික වැටුපක් මත 2008 මාර්තු 01 දින එම සමාගමේ සේවයට බැඳුණේය. දැන් ඔහු මසකට රු.200,000/- ක වැටුපක් ලබයි. ඔහුද, **තාරා** සමග විදේශගතවීම සඳහා 2019 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වනසේ සේවයෙන් අස්වීමේ ලිපිය බාරදී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සේවක භාර අරමුදලේ (ETF) දායක මුදල් ආපසු ලබාගැනීම පිළිබඳ ඇයගේ හිමිකම් **තාරාට, පැහැදිලි කරන්න**.

(ලකුණු 05)

(b) සේවයෙන් අස්වන දිනට **ශිවාගේ** පාරිතෝෂිත හිමිකම (gratuity entitlement) **ගණනය කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## 09 වන ප්‍රශ්නය

"ආදායකයාගේ ගිණුමට පමණයි" යනුවෙන් සඳහන් කළ චෙක්පතක් **කුමාර, දේවිකාට** නිකුත් කලේය. **දේවිකා** එය බැංකුවේ කවුන්ටරයට ඉදිරිපත් කොට මුදල් කරදෙන ලෙස ඉල්ලා සිටියාය. අයකැමි විසින් එය මුදල් කරදීම ප්‍රතික්ෂේප කර එය ඇගේ ගිණුමට තැන්පත්කරන ලෙසට **දේවිකාට** උපදෙස් දුන්නාය. **දේවිකා** අයකැමිගේ ප්‍රකාශය පිළිබඳව නොසතුටට පත්වුව ද බැංකුවේ ඇගේ ගිණුමට චෙක්පත තැන්පත් කළාය. මේ අතරතුර, **කුමාර** ඔහුගේ ගිණුම යටතේ නිකුත්කර ඇති ඕනෑම චෙක්පතකට ගෙවීම් කිරීම නැවැත්වීමේ නියෝගයක් බැංකුව වෙත නිකුත් කරන ලදී. ඊළඟ දවසේ ඇගේ චෙක්පත උපලබ්ධි නොවී ඇති බව දැනගත් **දේවිකා** බැංකුවේ කළමනාකරු වෙත ගොස් **කුමාරගේ** ගිණුමේ ශේෂය හා වෙනත් විස්තර පිළිබඳව විමසා සිටියාය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ගනුදෙනු කළ හැකි ලියවිලිවලට අදාලව අයකැමිගේ ප්‍රකාශයේ වලංගුභාවය **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) ඉහත සිද්ධිදාමයට අදාලව බැංකුකරුවෙකුගේ යුතුකම් (duties) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

*C කොටසෙහි අවසානය*

# <u>D කොටස</u>

අනිවාර්ය ප්‍රශ්නයකි.

(ලකුණු 25)

## 10 වන ප්‍රශ්නය

(A) කොළඹ පාදක කරගත් වෙන්දේසිකරුවෙකු වන **සමන්** වෙන්දේසියක් මගින් ගෘහ භාණ්ඩ සහ වෙනත් කාර්යාලයීය උපකරණ විකිණීම සඳහා ප්‍රචාරණය කළේය. බ්‍රෝකර්කරුවෙකු වන **ගජන්** වෙන්දේසියෙන් ගෘහභාණ්ඩ මිළදී ගැනීම සඳහා යාපනයේ සිට පැමිණියේය. කෙසේවෙතත්, පසුව, **සමන්** තම අදහස වෙනස්කොට කල් ඇතිව දැනුම් දීමකින් තොරව වෙන්දේසියෙන් ගෘහභාණ්ඩ ආපසු ඉවත් කර ගත්තේය. ගිවිසුම කඩකිරීම මත **සමන්ට** එරෙහිව නඩු පැවරීමට **ගජන්ට** අවශ්‍යව තිබේ. **තිමල්,** වෙන්දේසියෙන් කාර්යාලයීය උපකරණ මිළදී ගැනීම සඳහා කුරුණෑගල සිට පැමිණ සිටි තවත් බ්‍රෝකර්කරුවෙකි. ජායා පිටපත් යන්ත්‍රයක් සඳහා ඔහු විසින් රු.100,000/- ක ලන්සුවක් තැබූ අතර, වෙනත් බ්‍රෝකර්කරුවෙකු වන **සිතුම්** ද එම යන්ත්‍රය සඳහා රු.110,000/- ක ලන්සුවක් තැබිය. **සිතුම්ට** වෙන්දේසියෙන් එම ජායා පිටපත් යන්ත්‍රය මිළදී ගැනීමට හැකි වූ අතර, එය වැඩි මිලකට විකුණන බවට ඔහු විසින් නිවේදනය කළේය. මේ අනුව, රු.115,000/- කට තමාට එම යන්ත්‍රය නැවත විකුණන ලෙස **තිමල්, සිතුම්ගෙන්** ඉල්ලා සිටි නමුත්, ජායාපිටපත් යන්ත්‍රය ඔහුට මිළදී ගැනීමට අවශ්‍ය නම් රු.120,000/- ක් ගෙවන ලෙස **සිතුම්, තිමල්ගෙන්** ඉල්ලා සිටියේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **විමසන්න**:

(a) **සමන්** සහ **ගජන්** අතර වලංගු ගිවිසුමක් තිබේද යන වග. (ලකුණු 07)

(b) **තිමල්** සහ **සිතුම්** අතර, වලංගු ගිවිසුමක් තිබේද යන වග. (ලකුණු 08)

(B) **සමීර,** කුරුණෑගල පදිංචි දේශීය වශයෙන් බයිසිකල් නිෂ්පාදනය කරන්නෙකි. ඔහුගේ විශේෂත්වය වන්නේ ක්‍රීඩා බයිසිකල් නිෂ්පාදනය කිරීමයි. "ඕනෑම කාලගුණ තත්ත්වයකට සුදුසු නියම යකඩ සහ රන් ආලේපිත පට්ටමෙන් නිමවා ඇත. ආසනය ඕනෑම උසකට හරිගස්සාගත හැකි අතර, හැඩලය වේගපාලන ගුණාත්මක තත්ත්වය වැඩිකරන ඕලාකාර හැඩයෙන් යුක්ත වේ" යන විස්තරය ඒවායේ සඳහන් කර ඇත. නුවරඑළියේ පදිංචි **නුවන්** ඉදිරියේදී නුවරඑළියේ පැවැත්වීමට නියමිත බයිසිකල් ධාවන තරඟයේදී භාවිත කිරීම සඳහා ඉහත කී විස්තරය මත පදනම්ව බයිසිකලයක් ඇණවුම් කළේය. ඇණවුම්කර දින දෙකක් ගතවූ කල **නුවන්ට** ඔහුගේ බයිසිකලය ලැබුණි. කඳුකර ප්‍රදේශයක බයිසිකල් පැදීම සඳහා හැඩලය සුදුසු නැති බවත් ආසනය අවශ්‍ය කරන උසට හරිගස්සාගත නොහැකි බවත් **නුවන්** සොයා ගත්තේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **නුවන් ට** තිබෙන අයිතිවාසිකම් (rights) සහ ප්‍රතිකර්ම (remedies) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) භාණ්ඩ විකිණීමට අදාල නීතිය සම්බන්ධයෙන්, පහත සඳහන් දෑ **පැහැදිලි කරන්න**:

(i) පවත්නා භාණ්ඩ (existing goods).

(ii) අනාගත භාණ්ඩ (future goods). (ලකුණු 04)

(මුළු ලකුණු 25)

*D කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |